# 07 උපන් ගමට වැඩම වීම

සක්විති රාජ්‍යය පවා අතහැර ගිය සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ උතුම් බුදුපදවි ලැබූ පුවත සුදොවුන් රජතුමාට අසන්නට ලැබී බොහෝ කල් ය. තම අතිජාත බුදු පුතණුවන් දකින තුරු එතුමා සිටියේ නො ඉවසිල්ලෙනි. ඇමැතිවරයෙකුට අණකළ රජතුමා දහසක පිරිසක් සමඟ බුදුරදුන් වැඩමවාගෙන ඒමට රජගහ නුවරට පිටත් කර හැරියේ ය. බුදුරදුන් බැහැදුටු ඔවුහු බණ අසා පැහැදී පැවිදි බව ලබා රහත් වූහ. රාජකාරිය එතැනින් ඇණහිටියේ ය. බොහෝ කල් බලා සිටි රජතුමා තවත් ඇමැතිවරයෙකු දහසක පිරිසක් සමඟ යැවීය. ඔවුන්ට සිදුවූයේ ද එය ම ය. මෙසේ නව වාරයක් නව දහසක පිරිසක් සමග ඇමැතිවරු නව දෙනෙක් යැවූ නමුදු බලාපොරොත්තුව ඉටු නොවී ය. ඉන් රජතුමා මහත් කණස්සල්ලට පත්ව සිටියේ ය. අවසානයේ දී එම රාජකාරිය පැවරුණේ බෝසත් සිදුහත් කුමරු සමග එකදා උපන් කාළුදායී ඇමැති තුමාට ය. තමාට පැවිදිවන්නට අවසර දෙන්නේ නම් බුදුරදුන් වැඩමවා ගෙන එන්නෙමි යි හෙතෙම කියා සිටියේ ය. රජුගෙන් ඊට අවසර ලැබිණ.

කාළුදායී ඇමැතිවරයා ද දහසක පිරිසක් සමග බුදුරජාණන් වහන්සේ වෙත ගියේ ය. ඒ සියල්ලෝමත් බුදුරදුන් හමුවී බණ අසා පැවිදිව රහත් වූහ. කල්යල් බලා සිටි කාළුදයි තෙරණුවෝ සුදුසු අවස්ථාවක බුදුරදුන් හමුවී තමා ගෙනා පණිවුඩය මෙසේ පැවසූහ.

> අඞ්ගාරිනොදානි දුමා භදන්ත
> ඵලෙසිනො ඡදනං විප්පහාය
> තෙ අච්චිමන්තො ව පභාසයන්ති
> සමයො මහාවීර භගීරථානං

'' ස්වාමිනි, දැන් ගස් වැල්වල පැරණි කොළ හැලී, ගිනි අඟුරු වැනි මල් දලු හටගෙන පල දැරීමටත් ලංවී තිබෙයි. ඒ සියලු ගස්වැල් පහන්සිළු වාගේ මැනවින් බබළයි. මහා වීරයන් වහන්ස, ශාක්‍යයන්ට අනුග්‍රහ කිරීමට මේ කාලය යි.''

යනාදී ගාථා හැටකින් පමණ කරන සුන්දර වර්ණනාවකින් උන්වහන්සේ ඒ ආරාධනය කළහ. එහි දී රජගහ නුවර සිට කිඹුල්වතට යන සැට යොදුන් මාර්ගයත්, ඒ අවධියේ පැවැති ඍතුගුණයේ චමත්කාරයත් වර්ණනා කළ උන්වහන්සේ දැන් මව්බිම බලා වැඩම වීමට සුදුසු කාලය යැයි දන්වා සිටියහ. ආරාධනාව පිළිගත් බුදුරජාණන් වහන්සේ විසිදහසක් මහසඟන පිරිවරා මැදින් පුර පසළොස්වක පොහොය දින කිඹුල්වත් පුර බලා පිටත්වූ සේක.

## ශාක්‍යයන්ගේ මානය දුරු කිරීම

ගමනට දෙමසක් ගත විය. බුදුරජාණන් වහන්සේ වෙසක් පුර පසළොස්වක පොහොය දා කිඹුල්වත් පුරයට සැපත්වූ සේක. මුළු නුවර ම සරසා තිබිණ. විසිදහසක් මහ සඟන පිරිවරාගත් උන්වහන්සේ පිළිගැනීමටත්, උන්වහන්සේලාට වැඩහිඳීමටත් පිළියෙළකර තිබුණේ නිග්‍රොධ ශාක්‍යයාගේ උයන යි.

ශාක්‍යයෝ මාන්නාධික පිරිසකි. ඔවුන් බුදුරජාණන් වහන්සේ පිළිගැනීමට මුලින් ම පෙරමගට යැව්වේ කුඩා දරුවන්ය. අනතුරුව තරුණයන් ය. සියල්ලට ම පසුව වැඩිහිටියෝ ද මල් සුවඳගෙන පෙරමගට ගියෝ ය. බුදුරදුන් වැඩීමේ දී ද බාල පිරිස ලවා වැන්දවූවත් වැඩිහිටියෝ නොවැන්දහ. එහිදී ශාක්‍යයන්ට බුදුබලය කොතරම් දැ යි පෙන්වනු පිණිස උන්වහන්සේ යමා මහ පෙළහර දක්වා වදාළ සේක. එයින් ඔවුන්ගේ මානය දුරුවිය. සියල්ලෝ ම උන්වහන්සේ පාමුල වැඳ වැටුනහ. පිය රජතුමා ද මේ මාගේ තුන්වන වැඳීම යැයි කියමින් බුදු පාමුල වැඳ වැටුණේ ය. ඒ මොහොතේ මල් වැස්සක් ඇද හැලිණ. ඒ ප්‍රාතිහාර්යය නිමිතිකරගෙන බුදුරජාණන් වහන්සේ වෙස්සන්තර ජාතකය වදාළසේක.

සියල්ලෝ බණ අසා බුදුන් වැඳ නිවෙස් බලා ගියෝ ය. කිසිවෙක් පසුදා දනට ඇරැයුම් කළේ නැත. බුදුරජාණන් වහන්සේ පසුදා පෙරවරුවේ විසිදහසක් රහතුන් පිරිවරාගෙන කිඹුල්වත් නුවර මහමග පිඬු පිණිස වැඩි සේක. මේ පුවත යශෝධරා දේවියගෙන් පිය රජතුමාට සැළවිය. මහත් කළබලයට පත් සුදොවුන් රජතුමා සළුව හඳිමින් ම බුදුරදුන් වෙත දිව ගියේ ය.

රජතුමා බුදුරජාණන් වහන්සේ වැඳ '' ස්වාමීනි, අපට ලැජ්ජා කරවන්නේ ඇයි? සිඟා ඇවිදින්නේ කුමට ද? මේ භික්ෂු පිරිසට අහර සැපයීමට රජ වූ මට නොහැකි යැයි අඟවන සේක් ද? '' යි විමසීය. '' මහරජ , මේ අපේ වංශයේ සිරිත ය'' යි බුදුරජාණන් වහන්සේ වදාළහ. '' ස්වාමීනි, අපේ වංශය මහාසම්මත ක්ෂත්‍රිය වංශය යි. එහි සිඟා කෑ රජෙක් නැතැයි මහරජු කීය. එයට බුදුරජාණන් වහන්සේ '' මහරජ ඒ ඔබේ වංශය යි. අපේ වංශය දීපංකර ආදී බුදුවරුන්ගේ වංශයයි. සියලු බුදුවරු පිඬුසිඟා වැඩියෝ යැ'' යි වදාරා එහි දීම රජතුමාට උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය ආදි ගාථාවෙන් දහම් දෙසූහ. ඒ දෙසූ ධර්මය අසා සුද්ධෝදන රජතුමා සෝවාන් විය. අනතුරු ව රජතුමා බුදුරජාණන් වහන්සේ වැඩමවාගෙන රජමාලිගයට ගියේ ය. එහි දී දන් වැළඳූ බුදුරජාණන් වහන්සේ අනුමෙවෙනි දහම් දෙසූහ. එය අසා සිටි සුදොවුන් රජතුමා සකෘදාගාමී විය. සුළු මව වූ මහා ප්‍රජාපතී ගෝතමිය සෝවාන් වූවාය.

## පතිදම් රැකි සිල්වත් යශෝධරාවෝ

බුදුරජාණන් වහන්සේ වැඩි බව අසා රජමාළිගයේ සිටි සියලු ම කාන්තාවෝ බණ ඇසීමට පැමිණියහ. එහෙත් යශෝධරා දේවිය පමණක් පැමිණියේ නැත. '' මාගේ යම් පතිව්‍රතා ධර්මයක් වේ නම්, යම් සීලයක් වේ නම් බුදුරජාණන් වහන්සේ මා වෙත වැඩම කරනු ඇතැයි '' කියා ඇය සිය මැදුරට වී සිටියා ය. බුදුරජාණන් වහන්සේ පියරජු පළමුව පිටත් කොට යවා අගසව් දෙනම සමගින් එතුමියගේ මැදුරට වැඩම කළහ. ඇය බුදුරජාණන් වහන්සේ දැක බිම වැටී උන්වහන්සේගේ සිරිපා යුවල අල්ලාගෙන හිස ඒ මත තබාගෙන හඬන්නට වූවා ය. රජතුමා එය වැළැක්වීමට උත්සාහ ගත්ත ද බුදුරජාණන් වහන්සේ ඇගේ ශෝකය නිවෙන තුරු හඬන්නට ඉඩ දෙන්නැයි රජතුමන් වළකාලූහ.

ඇයගේ ආවේගය සංසිඳී ගිය පසු පිය රජතුමා තම ලේලිය වූ යශෝධරාව ගැන සඳහන් කරමින් '' බුදුරජාණන් වහන්ස, මේ යශෝධරාව පුදුම කාන්තාවක්. අප්‍රමාණ පති භක්තියකින් යුතු දියණියක්. ඔබ වහන්සේ රජමාලිගයෙන් ගිය දා පටන් ඇයත් රජසැප අත්හැරියා. ඔබ වහන්සේ කහවත් හඳින බව දැනගත් ඈ කහවත් ඇන්දා. මල්ගඳ විලවුන් සහ රන් රිදී අබරණ නොදරන බව අසා ඇයත් ඒවා අත්හැරියා. එක් වේලක් වළඳන බව අසා

ඇයත් එක් වේලක් ආහාර ගත්තා. උස් අසුන් මහ අසුන් අත්හළ බව අසා ඇයත් එසේ කළා. බොහෝ කුමාරවරු ඇය සරණපාවා ගැනීමට කැමැත්ත පළ කළත් ඇය ඒම යෝජනා ප්‍රතික්ෂේප කළා. ඇය ඔබ වහන්සේ වෙනුවෙන් ම ජීවිතය ගතකළා '' යනුවෙන් ඉතා දීර්ඝ ගුණ වර්ණනාවක් කළේ ය.

එය අසා සිටි බුදුරජාණන් වහන්සේ '' මහරජ මේ යශෝදරාවන් මෙසේ මා වෙත සෙනහසින් ගත කළේ අද පමණක් නොවේ. මෙබඳු මිනිස් ආත්මවලදී පමණක් නොව තිරිසන් භව වලදී පවා අසීමිත පති භක්තියකින් යුතු වූ කාන්තාවකැයි '' වදාරා සඳකිඳුරු ජාතකය දේශනා කළසේක.

## අභ්‍යාස

01. බෝසතුන් සමග ම උපන් (සහ ජාත) වස්තු සත සොයා ඔබේ අභ්‍යාස පොතේ සටහන් කර ගන්න.

02. චන්දකින්නර ජාතකය ජාතක පොතින් කියවා ශිෂ්‍ය සමිතියට ඉදිරිපත් කරන්න.

## පුහුණුවට

උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය
ධම්මං සුචරිතං චරෙ
ධම්මචාරී සුඛං සෙති
අස්මිං ලොකෙ පරම්හි ච

භික්ෂූන් වහන්සේ පිඬුසිඟා යාමට මැලි නොවිය යුතු ය. නිවැරදි ලෙස සිවුපසය සෙවීමෙ සුචරිත ධර්මය පිරිය යුතුය. ඒ සුචරිත ධර්මය පුරන මහණ තෙම මෙලොව පරලොව දෙකෙහි ම සුවසේ වසන්නේ ය.

(ධම්මපද - ලෝකවග්ග 2)